# කාර්ය සාධන වාර්තාව
# செயலாற்று அறிக்கை
# Performance Report
# 2017

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம் – இலங்கை

Department of Co-operative Development - Sri Lanka

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2017

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம் - இலங்கை
Department of Co-operative Development - Sri Lanka

# පෙරවදන

පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සේවා සපයන, ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා පාරිභෝගිකයාව මනාව හඳුනා ගනිමින් ඔවුන්ට අවශ්‍ය සේවා සපයන සුවිශේෂී ආයතනයක් ලෙස කටයුතු කරන මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 වසර තුළදී සුවිශේෂී කාර්යභාර්යක් ඉටු කරනු ලැබීය. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) 2017 වර්ෂය වෙනුවෙන් සම්පාදනය කරන ලද කාර්ය සාධන වාර්තාව ඔබ අතට පත් කරනුයේ ඉමහත් සතුටකිනි.

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානුබල සපයමින් සමුපකාර ආයතන වල යහ පාලනය ගොඩනැගීමට පුළුල් ලෙස මැදිහත්වීම මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

කුඩා පරිච්ඡේද 03 ක් යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගත වන්නේ මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තනේතුවේ මෙහෙවර තුළින් 2017 වර්ෂයට අදාළව ලබා ගත් දත්ත හා තොරතුරු වේ. මෙහි පළමු පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුවෙහි කාර්යන් සහ අභ්‍යන්තර පරිපාලනය පිළිබඳවත්, මානව සම්පත් පිළිබඳවත්, දෙවන පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු හා ව්‍යාපෘති පිළිබඳවත් තුන් වන පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කටයුතු සහ විගණනය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංගම් හා සමිති පිළිබඳවත් විස්තර ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්වභාවය හා ස්වරූපය පිළිබඳව දත්ත හා තොරතුරු ලබා ගැනීමට හැකිවේ. සමුපකාර ව්‍යාපාරයේ හර පද්ධතිය හඳුනා ගනිමින්, ජාතික සංවර්ධනයට සමුපකාරය දායක කර ගැනීමට වත්මන් ගරු අමාත්‍යතුමා ගන්නා උත්සාහයත්, කැපවීමත්, මග පෙන්වීමත් මෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමන් ලබා දෙන සහයෝගය හා මග පෙන්වීමත්, අධීක්ෂණයත් සමුපකාරය ගොඩනැංවීමට මහත් රුකුලක් වී ඇත. එසේම 2017 වර්ෂය තුළ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ (රේඛීය) සියළු කාර්යයන් සාර්ථක කරමින් සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා කටයුතු කිරීමට සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කර සිටින අතර විවිධ අභියෝගයන් හා බාධක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුළ දායකත්වය සැපයූ මාණ්ඩලික නිලධාරින් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය පුද කර සිටිමි.

එස්.එල්. නසීර්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

## දැක්ම

ජනතා ව්‍යවසායකයක් ලෙස තිරසාර
සංවර්ධනයට සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායකයක් ලෙස සංවර්ධනය
කිරීම සඳහා සානුබල සපයමින්,
සමුපකාර සමිතිවල යහ පාලනය
ගොඩනැගීම සඳහා
පුළුල් ලෙස මැදිහත් වීම.

# පටුන


1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය
   - 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්
   - 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
   - 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
     - 1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
     - 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්
     - 1.3.3 ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්
     - 1.3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්
     - 1.3.5 ස්ථාන මාරුවී ගිය නිලධාරීන්
   - 1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
     - 1.4.1 දේශීය පුහුණු
     - 1.4.2 විදේශීය පුහුණු
     - 1.4.3 මහජන බැංකු ආධාර මගින් සිදු කරනු ලබන පුහුණු වැඩසටහන්

2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
   - 2.1 2017 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම
   - 2.2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම
   - 2.3 සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම්
   - 2.4 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
   - 2.5 නීති කටයුතු
     - 25.1. ආරවුල් බේරුම්කරණය
     - 2.5.2 උසාවි බලගැන්වීම්
   - 2.6 අරමුදල් කළමනාකරණය
     - 2.6.1 සමුපකාර අරමුදල
     - 2.6.2 සමුපකාර අතිරික්ත අරමුදල
   - 2.7 2017 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම්
   - 2.8 ග්‍රාමීය බැංකු නියාමනය
   - 2.9 ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
   - 2.10 සැලසුම් කටයුතු
   - 2.11 මාධ්‍ය කටයුතු
   - 2.12 තොරතුරු තාක්ෂණ ඒකකය

3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
   - 3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්
   - 3.2. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති
     - 3.2.1. දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
     - 3.2.2. දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

# 01 පරිච්ඡේදය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මනුෂ්‍යයාගේ උපතේ සිට මරණය දක්වා සිදු කරනු ලබන අනේක වූ ක්‍රියාකාරකම් සියල්ල ආවරණය කිරීමට සමත් එක් ව්‍යාපාරයක් ලෙස හඳුන්වා දිය හැකි සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා තිරසාර සංවර්ධය අරමුණු කර ගනිමින් 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව මෙරට තුළ ස්ථාපිත විය. එය 1945 වර්ෂයේ දී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ස්ථාපිත වූ අතර වර්තමානයේදී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර ලාංකේය ජනතාවට පුළුල් මෙහෙවරක් ඉටු කරමින් තම සේවාව පවත්වාගෙන යනු ලබයි.

### 01. 1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම.
- ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම.

**සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු**

- සමිති ලියාපදිංචි කිරීම
- සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- නිළවරණ කටයුතු අධීක්ෂණය
- මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
- ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

**කළමනාකරණ කටයුතු**

- ❖ පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ❖ ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- ❖ විගණනය
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

**සම්බන්ධීකරණ කටයුතු**

- ❖ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- ❖ පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට සහය වීම.
- ❖ ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- ❖ අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම
- ❖ සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

**සංවර්ධන කටයුතු**

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

**අරමුදල් පාලනය**

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම
- ❖ ණය ආපසු අයකර ගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

**අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු**

- ❖ සාමාන්‍ය පරිපාලනය.
- ❖ මානව සම්පත් කළමනාකරණය.
- ❖ කාර්ය සාධනය වර්ධනය.
- ❖ වත්කම් කළමනාකරණය.

## 01. 2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 10 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්,

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය
7. බැංකු නියාමන අංශය
8. ව්‍යාපෘති අංශය
9. තොරතුරු තාක්ෂණ අංශය
10. මෙහෙයුම් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 01. 3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

මෙම දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි මෙම වසර තුළ සිදු වූ විශේෂි වූ සිදුවීම් කිහිපයකි.

වර්ෂ ආරම්භයත් සමාගම දෙපාර්තමේන්තු නියමුවන්ගේ වෙනසක් සිදු විය. දෙපාර්තමේන්තුවේ නව කොමසාරිස්වරයා ලෙස එස්.එල්. නසීර් මහතා වැඩ භාරගත්තේ වසරේ මුලභාගයේදීය. 2014 වර්ෂයේ ජූනි මාසයෙන් පසුව රේඛීය දෙපාර්තමේන්තුවට ස්ථිර වශයෙන්ම මෙම වසර තුළ කොමසාරිස්වරයෙකු පත් වී පැමිණීම ඉතා සතුටුදායකය. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ (රේඛීය) ශක්තිමත් හා පැහැදිලි ඉදිරි දැක්මක් සඳහා ඔහුගේ පැමිණීම මනා පිටුවහලක් විය.

සමුපකාරය දියුණු කිරීම හා එයට නව ජවයක් ඇති කිරීමට සමුපකාර ව්‍යාපාරයට තරුණ නායකයන් අත්‍යාවශ්‍යම සාධකයක් වී ඇත. ඉදිරි වසර කිහිපය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සමුපකාර ව්‍යාපාරයේ මාර්ග දැක්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා ද නව දැනුම සහිත පිරිසකගේ හිඟතාවය තදින්ම දැනී තිබුණි. එම අරමුණ සපුරා ගනුවස් සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට නවක නිලධාරින් 14 දෙනෙකු නොවැම්බර් මාසයේදී බඳවා ගැනීමට කටයුතු යෙදුණි.

එසේම මෙම දෙපාර්තමේන්තුවට දැඩි හිඟතාවයක්ව පැවති නීති නිලධාරී තනතුර සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 05 ක් අනුමත කර ගැනීමට හැකිවීමත් දීර්ඝ කාලයක් පුරප්පාඩුව පැවති භාෂා පරිවර්තක තනතුරට කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමද වසර තුළ සිදු වූ වැදගත් සිදුවීම් වේ. තවද රියදුරු හා කාර්යාල කාර්ය සහායක තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරින් බඳහා ගැනීම සඳහා ද මෙම වසර තුළ රාජ්‍ය පරිපාලන ඒකාබද්ධ අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතිය ලැබුණි.

තවද රාජ්‍ය කළමනාකරණ සහකාර III වන ශ්‍රේණියේ නවක පත්වීම් ලබා එක් නිලධාරියකු අප සමග සේවයට එක් වූ අතර කාර්යාල කාර්ය සහයක තනතුර සඳහා ද නිලධාරින් කිහිපදෙනෙකු සේවයට එක්විය. එසේම සමුපකාර සංවර්ධන නිලධාරී, රාජ්‍ය කළමනාකරණ සහකාර, රියදුරු සහ කාර්යාල කාර්ය සහයක තනතුරු වල සේවය කළ පිරිස් ද ස්ථාන මාරු වී යාමත් ස්ථාන මාරු ලැබ පැමිණීමත් මෙම වසර තුළ විටින් විට සිදුවිය.

## 01. 3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා පුරප්පාඩු

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2017.12.31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංකය | | තනතුර | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2016-12-31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ මට්ටම | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 | 00 |
| 02 | | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III) | 04 | 00 | 04 |
| 03 | | ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II, III) | 01 | 01 | 00 |
| 04 | | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 03 | 00 |
| 05 | | නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත II, III) | 01 | 00 | 01 |
| 06 | | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සේවය II, III) | 01 | 00 | 01 |
| | | **එකතුව** | **11** | **05** | **06** |
| 07 | තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| 08 | | සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය | 05 | 03 | 02 |
| 09 | | භාෂා පරිවර්තක | 01 | 00 | 01 |
| 10 | | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය - 2 පන්තිය II, III) | 02 | 00 | 02 |
| | | **එකතුව** | **09** | **04** | **05** |
| 11 | ද්විතීය මට්ටම | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | } 62 | 08 } 45 | 17 |
| 12 | | සමුපකාර සංවර්ධන නිලධාරී | | 37 | |
| 13 | | සංවර්ධන නිලධාරී | 15 | 23 | ** |
| 14 | | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය - 3 පන්තිය II, III) | 05 | 00 | 05 |
| 15 | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 20 | 08 |
| | | **එකතුව** | **110** | **88** | **30** |
| 16 | ප්‍රාථමික මට්ටම | රියදුරු | 05 | 04 | 01 |
| 17 | | කාර්යාල කාර්ය සහායක | 15 | 11 | 04 |
| | | **එකතුව** | **20** | **15** | **05** |
| | | මුළු එකතුව | **150** | **112** | **46** |

* සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය පුරප්පාඩු 02 සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියන් දෙදෙනෙකු රාජකාරි ආවරණයට 2017 වර්ෂයේදී පත් කර ඇත.

* සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර නිලධාරීන් සංවර්ධන නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කිරීම මත අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාවට වඩා අතිරික්තයක් ඇති වී ඇත.

## 01. 3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ආර්.එස්.එස්. රත්නායක මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 2 | කේ.ඒ.එන්. සමින්දනී මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 3 | ඒ.එන්. රංජන් මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 4 | ආර්.පී.එන්.පී. කරුණාසේන මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 5 | කේ.බී. මාරසිංහ මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 6 | එම්.එල්.ඩී. මහේශිකා මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 7 | ඩබ්.එම්.එල්. වීරසූරිය මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 8 | එම්.බී.ඒ.එස්. බණ්ඩාර මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 9 | එම්.එච්.එම්. අසාරුදීන් මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 10 | ආර්.එම්.කේ.සී. විජේරත්න මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 11 | ඩී.එම්.පී. අබේරත්න මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 12 | කේ. නරේෂ් මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 13 | කේ.ඒ.එම්.පී. කිරිඇල්ල මෙය | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 14 | කේ.ඩබ්.එන්.යූ. කුලතුංග මයා | සමුපකාර සංවර්ධන නිලධාරි III | 2017.11.07 |
| 15 | යූ.ඩී.ඒ. යසාංගනී මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.01.16 |
| 16 | ඒ.ඩී.කේ.එස්. දහනායක මිය | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |
| 17 | එම්.එම්. සිබ්රාන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |
| 18 | ඒ.එච්. අස්කින් මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |
| 19 | ඒ.එච්.එස්. රහුමාන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |
| 20 | එස්.එම්. සකීර් මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |
| 21 | එස්.ඒ. ෆර්සාද් | කාර්යාල කාර්ය සහයක III | 2017.04.03 |

## 01. 3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරුවීම් ලබා පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | එන්. හිමාලි පල්ලියගුරුගේ මිය | සමුපකාර සංවර්ධන නිලධාරී I | 2017.05.09 |
| 2 | ජේ.එම්.එම්.එස්. බණ්ඩාරමැණිකේ මිය | සමුපකාර සංවර්ධන නිලධාරී I | 2017.06.01 |
| 3 | බී.එම්.ඒ. මොහාන් ද සිල්වා මයා | සමුපකාර සංවර්ධන නිලධාරී I | 2017.08.24 |
| 4 | පී.ජී.එස්. හේමචන්ද්‍ර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2017.01.02 |
| 5 | ඩී.එම්.ජී.එස්. විජේසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2017.01.23 |
| 6 | ඊ.එච්.ඩී. ආනන්දසිරි මයා | කාර්යාල කාර්ය සහයක I | 2017.01.03 |
| 7 | ආර්.ඒ.ඩී. අතුල හේමන්ත මයා | කාර්යාල කාර්ය සහයක I | 2017.03.01 |

## 01. 3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

| අනු අංකය | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 01 | එච්.ටී. ප්‍රේමසූරිය මයා | කාර්යාල කාර්ය සහයක I | 2017.10.16 |

## 01. 3.5 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලැබූ දිනය |
|---|---|---|---|
| 1 | කේ.කේ.සී. ප්‍රසාද් මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂන සහකාර | 2017.07.21 |
| 2 | වයි.ඩී. ඩයනා කුමාරි මෙය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂන සහකාර | 2017.08.02 |
| 3 | ඒ.එස්.ජී. සජීවනී මිය | සමුපකාර සංවර්ධන නිලධාරී III | 2017.09.07 |
| 4 | එෆ්.එස්. කිචිල් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.01.23 |
| 5 | එම්.එම්. පෙරේරා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2017.02.02 |
| 6 | එම්. මයුරි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.06.05 |
| 7 | ඩී.එම්.ජී.එස්. විජේසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2017.10.02 |
| 8 | ජී.එච්.ආර්.ඩී. තෙන්නකෝන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.01.02 |
| 9 | ඊ.එච්.ඩී. ආනන්දසිරි මයා | කාර්යාල කාර්ය සහයක I | 2017.03.01 |
| 10 | එච්.ආර්.ජේ.එස්. සූරියබණ්ඩාර මයා | කාර්යාල කාර්ය සහයක III | 2017.04.17 |

## 01. 4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 01. 4.1 දේශීය පුහුණු

2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනය | කාලසීමාව | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | තත්ව පාලන මෙවලම් පිළිබඳ එක් දින වැඩමුළුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 2017.02.28 | වයි.ඩී. ඩයනා කුමාරි මෙය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br><br>ඊ.එම්. බටගම මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | Disciplinary Procedures in the Public Sector | මිලෝදා ආයතනය | 2017.03.23/24 | එම්.ආර්.එස්.කේ.එන්. නන්දසේන මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 3 | තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම පිළිබඳ වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 2017.04.24/25 | කේ.ජී.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 4 | Public Procurement Procedures වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 2017.07.28/29 | ආර්.ජී.ආර්.ආර්. කුමාර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 5 | ගබඩාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 2017 සැප්තැම්බර් 07 දින සිට බ්‍රහස්පතින්දා දින 05 | ඩී.එම්.ජී.එල්. දිසානායක මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 6 | Computation & Payment of Civil Pensions | නිපුණතා සංවර්ධන අරමුදල | 2017.10.02/03 | කේ.එම්. මිනෝලි මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br><br>ජී.එන්. කීඹියහෙට්ටි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 7 | Bid Document & Tender Procedures | මිලෝදා ආයතනය | 2017.10.11 /12/13 | කේ.ජී.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 8 | Advance Ms Excel Training for Junior Officer | මිලෝදා ආයතනය | 2017.10.30/31 | ඊ.එම්. බටගම මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 9 | වාර්ෂික ගබඩා පරීක්ෂණ හා පාවිච්චි කළ නොහැකි භාණ්ඩ අපහරණය | ප්‍රාග් ආයතනය | 2017.11.09 | ඊ.එම්. බටගම මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 10 | Information Season on Foreign Training Programmes | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2017.11.16 | ලලිතා බස්නායක මිය (පරිපාලන නිලධාරි)<br><br>ජී.එන්. කීඹියහෙට්ටි මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |

## 01. 4.2 විදේශීය පුහුණු

2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු, ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි වී ඇත.

| | වැඩසටහන | කාලපරිච්ඡේදය | පැවැත් වූ රට | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | 8th CEOS and regulators workshop road map to credit union network integration | 2017.03.06 සිට<br>2017.03.10 දක්වා | Korea | ජී.ජී. දයාසුමන මයා<br>(සහකාර කොමසාරිස්-සංවර්ධන) |
| 2 | 10th Asia - pacific co-operative Minister's conference consultation on Autonomy and Independence of co-operatives | 2017.04.18 සිට<br>2017.04.21 දක්වා<br>2017.09.14 සිට<br>2017.09.16 දක්වා | Vietnam<br>India<br>(Hyderabad) | එස්.එල්. නසීර් මයා<br>(සමුපකාර කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්) |
| 3 | International Programme on Agri value chain Financing | 2017.05.22 සිට<br>2017.05.26 දක්වා | India<br>(Pune) | ඩබ්ලිව්.එම්.එස්.එස්. ප්‍රනාන්දු මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එන්.එස්. සුදසිංහ මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>බී.ආර්. තරංගනී මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 4 | International Programme on Women's development through Micro Finance | 2017.08.28 සිට<br>2017.08.31 දක්වා | India<br>(Pune) | ඒ.අයි.ඒ. අධිකාරි මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ඒ.සී.බී. ජයංගා මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 5 | International Programme on management of Rural Financing Institutions and co-operative for rural development | 2017.09.18 සිට<br>2017.09.22 දක්වා | India<br>(Hyderabad) | එච්.එම්.පී.එම්. රූපරත්න මෙය<br>(සංවර්ධන නිලධාරි)<br>ජී.ආර්.ආර්. පතිරගේ මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ඩී.එම්.එස්.සී.බී. දහනායක මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 6 | Study of social co-operative International school consultation on Autonomy & Independence of co-operatives | 2017.10.17 සිට<br>2017.10.28 දක්වා | Italy | එස්.එල්. නසීර්<br>(සමුපකාර කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්) |
| | | 2017.09.14 සිට<br>2017.09.16 දක්වා | India | ඊ.එම්.එන්.ආර්. බණ්ඩාර මයා<br>(ගණකාධිකාරි) |
| 7 | International Programme on Agricultural and rural development through co-operative business model | 2017.11.01 සිට<br>2017.11.04 දක්වා | India<br>(Haryana) | ජී.පී.ටී.පී. ගනේගොඩ මිය<br>(සංවර්ධන නිලධාරි)<br>ටී.ඒ.එල්. ගුණරත්න මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එච්.එම්.ජී.පී. හේරත් මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 8 | ආයෝජන අවස්ථා හඳුනා ගැනීම | 2017.11.11 සිට<br>2017.11.15 දක්වා | Dubai | මොහාන් ද සිල්වා මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 9 | International Programme on Dairy development through co-operative business model | 2017.12.05 සිට<br>2017.12.08 දක්වා | India<br>(Gujarat) | කේ.ඒ.ඩී.පී.එල්. කහඳවල මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එම්.ඩී.පී. තමාලි මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 10 | International Programme on Application of Information Technology for development of agricultural co-operatives for rural financing Institutions | 2017.12.18 සිට<br>2017.12.22 දක්වා | India<br>(Pune) | එන්.එච්. පල්ලියගුරුගේ මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ජේ.එච්.එම්.එස්. බණ්ඩාර මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |

## 01. 4.3 මහජන බැංකු ආධාර මගින් සිදු කරනු ලබන පුහුණු වැඩසටහන්

| | දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූවන් |
|---|---|---|---|
| 01 | 2017.01.19/20 | ආයතනික හා වෙනත් මුල්‍ය සේවා සමුපකාර සමිති වල අධ්‍යක්ෂක මණ්ඩල සඳහා සමුපකාර ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම සහ නායකත්ව සංවර්ධනය සහ තීරණ ගැනීමේ පුහුණු වැඩමුළුව | සමිති අධීක්ෂණ නිලධාරීන් සහ සමිති නිලධාරීන් |
| 02 | 2017.01.26/27 | දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩමුළුව | දෙපාර්තමේන්තු සියළු නිලධාරීන් |
| 03 | 2017.02.08 | ඵලදායිතා සංකල්ප පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | දෙපාර්තමේන්තු සියළු නිලධාරීන් |
| 04 | 2017.02.14 | සමුපකාර වැටුප් චක්‍රලේඛ පිළිබඳව දැනුවත්කිරීමේ වැඩමුළුව | දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් |
| 05 | 2017.02.16 | සංඛ්‍යාන වාර්තාව සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ රේඛීය දෙපාර්තමේන්තු නිලධාරීන් |
| 06 | 2017.02.16 | සමුපකාර සංගම් වල වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ වැඩමුළුව | සමුපකාර සංගම් වල නිලධාරීන් |
| 07 | 2017.02.17/18 | මූලික විමර්ෂන, ආරවුල් බේරුම්කරණය හා අධිභාර ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් |
| 08 | 2017.04.25 | සමුපකාර සංවිධාන තුල මානව චර්යාවන් පිළිබඳ පුහුණු වැඩමුළුව | දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සහ සමිති සංගම් සභාපති, සාමාන්‍යාධිකාරි, ගණකාධිකාරි |
| 09 | 2017.05.06 | උසාවි රාජකාරි පිළිබඳ පුහුණු වැඩමුළුව | දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් |
| 10 | 2017.05.22/23 | මන්නාරම් දිස්ත්‍රික් සමුපකාර සමිති යාවත්කාලීන කිරීමේ වැඩසටහන සහ සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්, යුතුකම් හා කලමනාකරණ තීරණ ගැනීමේ නායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | දෙපාර්තමේන්තු නිලධාරීන් සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් |
| 11 | 2017.08.12 | සමුපකාර කාර්ය සාධන ඇගයීමේ වැඩමුළුව | සමිති අධීක්ෂන නිලධාරීන් සහ සමිති නිලධාරීන් |
| 12 | 2017.08.25/26 | උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම | දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් සහ සමුපකාර නායකයින් |
| 13 | 2017.09.23 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල, මහසභා නියෝජිතයින් හා කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරීන් සහ සමිති නිලධාරීන් |
| 14 | 2017.10.13 | සමුපකාර සංගම් වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩමුළුව | සමිති අධීක්ෂන නිලධාරීන් සහ සංගම් අධ්‍යක්ෂ මණ්ඩල |
| 15 | 2017.11.09 | නවක නිලධාරීන් බඳවා ගැනීම | සමුපාකාර සංවර්ධන නිලධාරීන් |
| 16 | 2017.12.09/10 | සුහදතාවය වර්ධනය කිරීමේ වැඩමුළුව | දෙපාර්තමේන්තු සියළු නිලධාරීන් |

# 02 පරිච්ඡේදය

## සංවර්ධන ක්‍රියාකාරකම්

### 02. 1 2017 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

2017 වර්ෂය තුළ සමුපකාර සමිති කිහිපයක් ලියාපදිංචි කර ඇත.

| | සමිතියේ / සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස සමස්ථ ලංකා මල් පැළ වගාකරුවන්ගේ සමුපකාර සමිතිය | සමු. 52 | 2017.05.31 |
| 02 | සී/ස විගණන හා කළමනාකරණ සේවා සැපයීමේ සමුපකාර සමිතිය | සමු. 53 | 2017.08.24 |
| 03 | සී/ස ශ්‍රී ලංකාවේ හරිත සමුපකාර සමිතිය | සමු. 54 | 2017.11.17 |
| 04 | සී/ස ජාතික පරිසර සුරකින්නන්ගේ සමුපකාර සමිතිය | සමු. 55 | 2017.11.17 |

### 02. 2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

| | සමිතියේ / සංගමයේ නම |
|---|---|
| 01 | සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සැකසුම්කරුවන්ගේ ණය දෙන සමිතිය |
| 02 | සී/ස ලංගම සේවක සකසුරුවම් සුභ සාධක සමුපකාර සමිතිය |
| 03 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය |
| 04 | සී/ස ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය |
| 05 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය |
| 06 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ සහ ණය දෙන සමිතිය |
| 07 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය |
| 08 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණය දෙන සමිතිය |
| 09 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර මහා සංගමය |

### 02. 3 සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම

| | සමිතියේ / සංගමයේ නම | නිලවරණ පැවැත් වූ දිනය |
|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සංගමය | 2017.06.10 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 2017.08.19 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථායීය ස.ණ.ස. සමිතිය | 2017.10.20 |

## 02. 4 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ විගණන අංශය විසින් 2012 සිට 2017 දක්වා සැලසුම් කරන ලද හා කාර්යාලය වෙත ලද විගණන වාර්තා පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| වර්ෂය | සැලසුම් කළ විගණන | නිම කළ විගණන | වර්ෂය තුළ නිමකල විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2012 | 83 | 63 | 76% |
| 2013 | 74 | 61 | 82% |
| 2014 | 68 | 44 | 64.7% |
| 2015 | 80 | 11 | 13.75% |
| 2016 | 102 | 37 | 36.27% |
| 2017 | 58 | 43 | 74.13% |

**වර්ෂ 6 ක සැලසුම් කළ විගණන හා නිම කළ විගණන**



## 02. 5 නීති කටයුතු

නීති කටයුතු වලට අදාල ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- ❖ සමුපකාර සමිති වලට සම්බන්ධ නීති රීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහය ලබාදීම.

- ❖ ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම.

- ❖ සමුපකාර පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රධානයන් ලබාදීම, අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම.

- ❖ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම.

## 02. 5.1 ආරවුල් බේරුම්කරණය

1992 අංක 11 හා 1983 අංක 32 දරණ සංශෝධන පනත් මගින් කියවෙන 1972 අංක 5 දරණ සමිති පනතේ 58 වන වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති වලින් බේරුම්කරණය සඳහා 2017 වසර තුළ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගොනුවල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | එකතුව |
|---|---|
| 2016.12.31 දිනට බේරුම්කරුවන් වෙත යොමු කිරීමට පවතින ගොනු සංඛ්‍යාව | 263 |
| 2017 වර්ෂයේ බේරුම්කරණය සඳහා කාලය තුළ ගොනු සංඛ්‍යාව | 74 |
| යොමු කිරීමට ඇති ගොනු සංඛ්‍යාව | 337 |
| 2017 වර්ෂයේ ආරවුල් බේරුම්කරණය සඳහා යොමු කිරීම | 208 |
| 2017.12.31 දිනට බේරුම්කරණය සඳහා යොමු කිරීමට ඇති සංඛ්‍යාව | 129 |
| 2017 වර්ෂය තුළ තීන්දු ලබාදී ඇති ගොනු සංඛ්‍යාව | 105 |

## 02. 5.2 උසාවි බලගැන්වීම්

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබා දීමෙන් පසු අදාල මුදල් අය නොවන්නේ නම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල දඩ මුදලක් සේ අය කර ගැනීමට අදාල මහේස්ත්‍රාත් අධිකරණයන් හි බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාල සමුපකාර සමිතිය වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

| | |
|---|---|
| 2017.01.01 දිනට උසාවි බල ගැන්වීමට ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 713 |
| 2017 වර්ෂය තුළ උසාවි බලගැන්වීමට ලද ඉල්ලීම් සංඛ්‍යාව | 02 |
| 2017 වර්ෂය තුළදී උසාවි බලගැන්වීම් සංඛ්‍යාව | 214 |
| 2017.12.31 දිනට උසාවි බලගැන්වීමට ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 501 |

## 02. 6 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) (ආ) වගන්ති සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදලේ දායක අයකර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලබයි.

- ❖ සමුපකාර අරමුදල
- ❖ සමුපකාර අතිරික්ත අරමුදල

## 02. 6.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

## 02. 6.2 සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 (3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44 (iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

## 02. 7 2017 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
### පුනරාවර්තන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/ වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2017-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 29,550,000.00 | 29,363,176.37 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 750,000.00 | 743,819.67 |
| 1003 | වෙනත් දීමනා | 19,400,000.00 | 19,361,753.14 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 1,400,000.00 | 1,397,958.87 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 1,200,000.00 | 1,003,611.73 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,683,000.00 | 1,682,950.86 |
| 1202 | ඉන්ධන | 1,520,000.00 | 1,473,000.00 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000.00 | 99,939.00 |
| 1301 | වාහන | 1,600,000.00 | 1,447,392.52 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 600,000.00 | 548,987.91 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 1,315,000.00 | 1,130,130.65 |
| 1403 | විදුලිය හා ජලය | 3,000,000.00 | 2,681,438.95 |
| 1404 | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 950,000.00 | 925,937.94 |
| 1409 | වෙනත් | 3,180,000.00 | 3,179,951.15 |
| 1505 | වෙනත් සම්මාදම් සහ දායක මුදල් | 400,000.00 | 394,505.96 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 735,000.00 | 729,828.35 |
| 1701 | පාඩු හා කපා හැරීම් | 150,000.00 | 144,979.75 |
| | **එකතුව** | **67,383,000.00** | **66,309,362.82** |

## මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2017-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | 89,034.00 |
| 2003 | වාහන | 400,000.00 | 36,400.00 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 10,350,000.00 | 10,350,000.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000.00 | 398,629.50 |
| 2202-1 | සමුපකාර ප්‍රචාරණය-සමුපදීපනී පුවත්පත මුද්‍රණය | 5,244,000.00 | 5,244,000.00 |
| 2202-3 | සංඛ්‍යා ලේඛන වාර්තාව | 216,000.00 | 215,548.03 |
| 2202-3 | නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන | 3,258,000.00 | 3,257,207,44 |
| 2202-4 | මූල්‍ය සේවා නියාමනය (ග්‍රාමීය බැංකු නියාමනය) | 1,700,000.00 | 1,699,596.17 |
| 2202-5 | සමුපකාර ගම්මාන ව්‍යාපෘතිය | 6,000,000.00 | 6,000,000.00 |
| 2202-6 | කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති නඟා සිටුවීම | 3,632,000.00 | 3,631,207.40 |
| 2401 | පුහුණු කිරීම හා හැකියා වර්ධනය | 200,000.00 | 198,225.00 |
| | එකතුව | **31,500,000.00** | **31,119,847.54** |

## වියදම් එකතුව

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2017-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 67,383,000.00 | 66,309,362.82 |
| 02 | මූලධන වියදම් එකතුව | 31,500,000.00 | 31,119,847.54 |
| | මුළු එකතුව | **98,883,000.00** | **97,429,210.36** |

## 02. 8 ග්‍රාමීය බැංකු නියාමනය

| අනු අංකය | ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ලඟාකර ගැනීම |
| 01 | සමුපකාර සමිති වලින් නිවැරදි දත්ත සහ තොරතුරු රැස් කර යාවත්කාලීන පවත්වාගෙන යාම | වාර්තා සංඛ්‍යාව | 36 | 27 |
| 02 | ස්ථානීය පරීක්ෂණ, මහජන පැමිණිලි සහ අභියාචනා විභාග කිරීම | විභාග කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 08 | 03 |
| 03 | මධ්‍යම රජයේ නිලධාරීන්, පළාත් නිලධාරීන් සහ සමුපකාර සමිති නිලධාරීන් පුහුණු කිරීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 12 | 10 |
| 04 | සමුපකාර බැංකු නියාමනයට අදාළ නව අත්පොත් චක්‍රලේඛ, උපදෙස් සහ නීති සම්පාදනය කිරීම | සකස් කරන ලද චක්‍රලේඛ සංඛ්‍යාව | 05 | 03 |
| 05 | සමුපකාර බැංකු නියාමන ජාතික කමිටු රැස්වීම් පැවැත්වීම | රැස්වීම් සංඛ්‍යාව | 06 | 02 |

## 02. 9 ව්‍යාපාති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

### ❖ නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන

නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ 2017 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගය ඉලක්ක කර ගනිමින් වයඹ, බස්නාහිර, නැගෙනහිර සහ මධ්‍යම පළාත් වලට අයත් පාසල් කිහිපයක සම්මන්ත්‍රණ මාලාවන් පැවැත් වූ අතර එම සම්මන්ත්‍රණ මාලාව සඳහා සහභාගී වූ සිසුන් ඉගෙනුම ලබන පාසල් වල පුස්තකාල වෙත පොත් ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුව විසින් මුල්‍යාධාර සපයන ලදී. මෙම පාසල් සඳහා පොත් ලබා ගැනීමට මුල්‍යාධාර ලබාදීමේදී ජාතික මට්ටමේ පාසල් සඳහා රුපියල් 50,000.00ක් ලබා දීමටත් සෙසු පාසල් සඳහා රුපියල් 25,000.00 ක් ලබාදීමත් සිදුවිය. එමෙන්ම අ.පො.ස. සා/පෙළ විභාගය ඉලක්ක කර ගත් වැඩසටහන් වලට අමතරව 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් සම්මන්ත්‍රණයක් පවත් වන ලදී.

"නැණ ශක්ති" වැඩසටහනෙහි මූලික අරමුණ ලෙසින් ජාතික මට්ටමේ පාසල් සමුපකාර සමිති පිහිටුවීම සඳහා 2017 වසර තුළදී කටයුතු සංවිධානය කෙරුණු අතර ඒ සඳහා අවශ්‍ය මූලික තොරතුරු සපයා ගැනීම සඳහා පාසල් සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාව සම්මන්ත්‍රණ පැවැත් වූ පාසල් වෙත ලබා දෙන ලදී. "නැණ ශක්ති" පාසල් සමුපකාර සමිති ජාතික මට්ටමේ පාසල් සමුපකාර සමිතියක් ලෙසින් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රවර්ධන වැඩසටහන යටතේ කුලි/ ශාන්ත ජෝෂප් මහා විද්‍යාලය පාසල් සමුපකාර සමිතිය මුල්‍යාධාර සහ ගෘහ භාණ්ඩ ලබා ගැනීම සඳහා ආධාර ලබාදීම මෙම වසර තුළදී සිදු කෙරුණු තවත් සුවිශේෂී කාර්යයකි.

### ❖ ජනතා මෙහෙවර

2017 වසර මැද භාගයේදී රටට බල පෑ අයහපත් කාලගුණික තත්වය මත ඇති වූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් රටේ විශාල පිරිසකට උන්හිටි තැන් අහිමි විය. තවත් විශාල පිරිසක් විවිධ ආපදාවන්ට ලක් විය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමග එක්ව අප දෙපාර්තමේන්තුව ද රත්නපුර දිස්ත්‍රික්කයේ එලෙස පීඩාවට පත් ජනතාව වෙනුවෙන් වියළි ආහාර, නිදන මෙට්ට, සනීපාරක්ෂක උපකරණ හා මුළුතැන්ගෙයි උපකරණ ලබාදීමට කටයුතු කළේ සමාජ සත්කාරයක් ලෙසිනි. ශ්‍රී ලංකාව පුරා පිහිටි සමුපකාර සමිති ද වෙනත් ප්‍රදේශ වල එලෙස අවතැන් වූ හා පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් විවිධ ආධාර, උපකාර කිරීමට කටයුතු කර තිබීම සමුපකාරය වෙනුවෙන් නිබඳව ම ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කැප වී සිටින බව පෙන්වයි.

### ❖ 95 වැනි ජාත්‍යන්තර සමුපකාර දින සැමරුම

ජූලි 01 වැනි දිනට යෙදී තිබුණු 95 වැනි ජාත්‍යන්තර සමුපකාර දිනය 2017 වසරේදී ශ්‍රී ලංකාව පුරා සමුපකාරිකයන් ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් සැමරූහ. ජාතික හා පළාත් මට්ටමින් විශිෂ්ටතා දැක් වූ සමුපකාර සමිති සඳහා සම්මාන පිරිනැමීම, කෝප් කුමරා, කුමරිය සහ කොප් ස්ටාර් තේරීම ආදී විවිධාකාරයෙන් සමුපකාරිකයින් ඇගයීම 2017 වසර තුළදී සමුපකාර දිනයට සමගාමීව සිදු කරන ලදී. මේ සියල්ල අගයමින් 95 වැනි සමුපකාර දින සැමරුම් උළෙල ජූලි මස 01 වන දින කුරුණෑගල මාළිගාපිටිය ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ශවත් ලෙස පවත් වන ලදී. එහිදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 ඉදිරි සැලැස්ම ජනාධිපතිවරයාට පිළිගැන්වීම කැපී පෙනෙන සිදුවීමක් විය.

### ❖ 2020 මාර්ග දැක්ම

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය නව මඟකට යොමු කරමින්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ, සමුපකාරය ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ක්‍රියාත්මක නොවූ ක්ෂේත්‍ර කරා ක්‍රියාත්මක වීමත්, සමුපකාරය මෙතෙක් ඉටු කළ මෙහෙවරෙන් ඔබ්බට ගොස් පිරිපුන් ජනතා මෙහෙවරක් ඉටු කිරීමටත් 2020 මාර්ග දැක්ම මෙම වසරේ ජූලි 01 වන දින ජනාධිපතිවරයාට පෙන්වා එළි දක්වන ලදී. සමුපකාර ව්‍යාපාරයේ නීතිමය රාමුව හා ප්‍රතිපත්ති මාලාව යාවත් කාලීන කිරීම, නව තොරතුරු තාක්ෂණික පද්ධතියක් හරහා සමුපකාර ව්‍යාපාරය ඒකාබද්ධ කිරීම, නව තාක්ෂණික ලෝකයකට ගැලපෙන පුහුණු අවස්ථා ලබාදීම තුළින් සමුපකාරිකයින්ගේ නායකත්වය හැකියා ගොඩනැංවීම, පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙලවල්, සාමය හා සංහිඳයාව වර්ධනය හා නව සමුපකාර නිෂ්පාදන විවිධාංගීකරණ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

සමුපකාරය ශ්‍රී ලංකා ආර්ථිකයේ තෙවැනි බලවේගය කිරීම මෙහි අරමුණ වේ. මෙම අරමුණු ඔස්සේ ක්‍රියාත්මකවීමට අවශ්‍ය අඩිතාලම සකස් කරමින් 2020 මාර්ග දැක්ම සකස් කිරීමේ කටයුතු 2017 වසර තුළදී ආරම්භවීම මෙම වසරේ අප දෙපාර්තමේන්තුව තුළ සිදු වූ තවත් සුවිශේෂී සිදුවීමකි.

## ❖ ආහාර නිෂ්පාදන ජාතික සංග්‍රාමය

කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හේතුවෙන් රටේ එක් ප්‍රදේශයක් ගංවතුර හා නායයෑම් වලින් පීඩාවට පත්වෙද්දී, තවත් ප්‍රදේශයක් නියං කාලගුණය හේතුවෙන් පීඩාවට පත්වීම විශේෂයෙන් අවධානය යොමු කළ යුත්තක් විය. එවන් තත්ත්වයක් තුළ අප රටේ වගා බිම් රාශියක් විනාශයට පත්වීම හමුවේ ජාතික ආහාර නිෂ්පාදනය දැඩි ලෙස අභියෝගයට ලක්විය. මේ හේතුවෙන් ජනතාවට සිදුවන පීඩාවන් අවම කිරීම සඳහා ක්‍රියාත්මක වූ ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයේ ගෙවතු වගා ප්‍රවර්ධන හා බීජ බෙදාහැරීමේ වැඩසටහන සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර සමිති සමඟ එක් වී දැක් වූ දායකත්වය සුවිශේෂී වූවකි.

## ❖ සමුපකාර ගම්මාන ව්‍යාපෘතිය

සමුපකාර ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ ආදායම් උත්පාදනය ප්‍රවේශයක් ඉලක්ක කොටගෙන ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් වෙත යෙදවීමට තීරණය විය. පොළොන්නරුව දිස්ත්‍රික් විවිධ සේවා සමුපකාර සමිති සහ වෙනත් සමුපකාර සමිති වල මුදුන් මට්ටමේ සංවිධානය වන්නේ සමුපකාර මණ්ඩලයයි. සියළු සාමාජිකයින්ගේ සහ සේවකයින්ගේ දැනුම, ආකල්ප හා කුසලතාවයන් වැඩි දියුණු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවේ පැවරී ඇති වගකීම් මෙම සංවිධානයේ ප්‍රමුඛ කාර්යය වේ. දිස්ත්‍රික්කයේ සාමාජිකයින් 150,000 හා සේවකයින් 750 කට ආසන්න ප්‍රමාණයක් සඳහා පවතින ප්‍රමුඛතම පුහුණු මධ්‍යස්ථානය මෙම ආයතනයයි. මෙහි සාමාජික සමිති නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වී ඇති අතර ඒ තුළින් කටයුතු මෙහෙයවයි. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය දිවයිනේ ප්‍රමුඛතම සමුපකාර ආයතනය වන අතර එහි සාමාජිකත්වය දිස්ත්‍රික්කය වෙනුවෙන් නියෝජනය වන්නේ මෙම දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලය මගිනි. එසේ හෙයින් දැවැන්ත මානව සම්පතක් පුහුණු කිරීම සඳහා මෙම ආයතනය උපයෝජනය කර ගත හැකි අතර එම සත්කාරය සඳහා පුහුණු සම්මන්ත්‍රණ ශාලාව මහත් පිටුවහලක් බැවින් මෙම වසරේදී එය ඉදි කිරීම සඳහා මුල්‍යාධාරයක් ලබාදීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබීය.

සමුපකාරික ප්‍රජාව තුල නව තාක්ෂණයන් සහ දියුණු වූ ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුමක් ඇති කරමින් ඵලදායි ආර්ථිකයක් සඳහා මෙහෙයවීමට දායකවීම, සමුපකාරික ප්‍රජාව සමුපකාරිකයන් බවට පත් කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම ඔවුන් තුළ ඇති කිරීමට කටයුතු කිරීම, සමුපකාරික නායකත්වය සඳහා තරුණ දායකත්වය නියෝජනය කිරීමට අවශ්‍ය කුසලතාවයන් වැඩි දියුණු කිරීමට උචිත වූ සානුබල ලබාදීම, පාසල් දරුවන් හා ළමුන් තුළ ගුණ ධර්ම වැඩි දියුණු කිරීම සඳහා පුහුණුවට අවශ්‍ය නායකත්වය ලබාදීම, සමුපකාර සේවකයන් තුළ ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය වන්නා වූ දියුණු කර ගන්නා ලද විෂය ක්ෂේත්‍රයන් තුළ පුහුණුව ලබාදීම හා ප්‍රජා නායකත්වය සඳහා කාන්තාවන්ගේ දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් සජීවීකරණය කිරීම අරමුණු කර ගනිමින් සමුපකාර ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලය සඳහා ශ්‍රවණාගාරයක් ඉදි කිරීම සඳහා අඩිතාලම දැමීමට මෙම වසර තුළදී මුල්‍යාධාර සපයනු ලැබීය.

## ❖ කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති නගා සිටුවීම

සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2017 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව මගින් කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති නගා සිටුවීමට කටයුතු සැලසුම් කරන ලදී. ඒ අනුව නිෂ්පාදන සමුපකාර සමිති නගා සිටුවීමේ වැඩසටහන යටතේ සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ "සසෙත් මුද්‍රණාලය" නවීකරණය සඳහා මුල්‍යාධාර ලබාදීමත් සී/ස දූනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ පොල් කටු ඉවත් කිරීමේ මැෂිමක් මිලදී ගැනීමට මුල්‍යාධාර ලබාදීමත් මෙම වසර තුළදී සිදුකරන ලදී.

## 02. 10 සැලසුම් කටයුතු

➢ **සංඛ්‍යා ලේඛන වාර්තාව**

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිති/සංගම් හා පළාත් දෙපාර්තමේන්තු යටතේ පවතින සමිති/සංගම් වල තොරතුරු ඒකරාශි කොට ඒවා ඒකාබද්ධ කර සංඛ්‍යා ලේඛන වාර්තාව සකස් කරනු ලබන අතර මෙම වාර්තාව සමුපකාරිකයින්ට මෙන්ම ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකේය ප්‍රජාවට වැදගත් වේ. ඒ අනුව 2016 වසර තුළ වූ තොරතුරු ඒකාබද්ධ කොට මෙම වසර තුළදී සංඛ්‍යා ලේඛණ වාර්තාව සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුනි.

➢ **ක්‍රියාකාරි සැලැස්ම**

2017 වර්ෂයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය සැලසුම් ගත කිරීම හා කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනිමින් වර්ෂ ආරම්භයේදී සියළු අංශයන්හි කාර්යභාරය ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. එම සැලැස්මට අනුව 2017 වසර තුළදී මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් මනාව සිදු කරනු ලැබුණි.

## 02. 11 මාධ්‍ය කටයුතු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රමුඛතම කාර්ය වන්නේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව රටේ ජනතාවට තොරතුරු බෙදාදීමයි.

**සමූපදීපනී පුවත්පත**

ඒ සඳහා 2006 වසරේ සිට සමුපදීපනී පුවත්පත් අතිරේකය නිකුත් කිරීමෙන් එම කාර්ය ඉටු කරනු ලබයි. සෑම මසකම අවසන් සිකුරාදා දින සමුපදීපනී සිංහල මාධ්‍ය අතිරේකය පිටු 08 න් යුතුව දිනමිණ පුවත්පත සමග ද දෙමළ මාධ්‍ය අතිරේකය එක් පිටුවකින් යුතුව තිනකරන් පුවත්පත සමග ද එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධ වී ප්‍රකාශයට පත්කරනු ලබයි. මෙහිදී රට වටා ඇති සමුපකාර සමිති වලින් සාර්ථක සමිති පිළිබඳව සවිස්තර වාර්තා ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය සිට විකාශය දක්වා වාර්තා පළ කිරීම, ලෝක සමුපකාර ව්‍යාපාරය පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම වැනි දෑ සමුපදීපනී පුවත්පතේ පළ කරයි.

## 02. 12 තොරතුරු තාක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ක්‍රියාත්මක රාජ්‍ය ව්‍යවසායන් සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ තරඟ කරන දැවැන්ත ව්‍යවසායක් ලෙස සමුපකාර ව්‍යාපාරය සියවසකට ආසන්න කාලයක් තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත් වර්තමාන සමුපකාර ව්‍යාපාරයේ ආර්ථික හා ආර්ථික නොවන තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා ගැනීමේ අපහසුව නිසාම රටේ ආර්ථික තීරණ ගැනීමේදී ද සමුපකාර ව්‍යාපාරය මඟහැරී ගොස් ඇත.

මෙම අඩුපාඩුව හඳුනාගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ස්වයංක්‍රිය කළමනාකරණ තොරතුරු පද්ධතියක් යටතේ සිදු කිරීමටත් පසුව සමුපකාර ව්‍යාපාරය මෙම තොරතුරු පද්ධතිය මගින් සම්බන්ධ කර ගැනීම මගින් මෙම අඩුපාඩුව මගහරවා ගනමින් ඵලදායී කාර්යක්ෂම සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපනය කිරීමේ අරමුණ සහිතව 2017 වර්ෂයේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපනය කරගන්නා ලදී.

ඒ අනුව ස්ථාපනය කළ තොතුරු තාක්ෂණ ඒකකය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ නිළධාරින් 08 දෙනෙකුගෙන් සමන්විත නිළධාරි මණ්ඩලයක් දෙපාර්තමේන්තු සේවය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගන්නා ලදී. ඉන්පසුව සමුපකාර දෙපාර්තමේන්තුවේ කටයුතු ස්වයංක්‍රීය පරිගණක පද්ධතියක් මගින් සිදු කිරීම හා සමස්ථ සමුපකාර ව්‍යාපාරයම එක් කළමනාකරණ තොරතුරු පද්ධතියකට සම්බන්ධ කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් 2017 වර්ෂයේදී සකස් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම ව්‍යාපෘතිය සඳහා උපදේශකත්වය ලබා ගැනීම සඳහා කැළණිය විශ්ව විද්‍යාලය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව පත්කර ගන්නා ලදී.

තොරතුරු තාක්ෂණ ඒකකය ලෙස ඉහත ව්‍යාපෘතියට අමතරව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සෑම අංශයකින්ම එක් නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් ස්ථාපනය කර එම කමිටුව තීරණ පරිදි හා සමුපකාර සංවර්ධන කොමසාරිස් තුමාගේ අනුමැතිය සහිතව වසරක කාලයක් සඳහා වෙබ් අඩවියේ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා Procons Infotech (Pvt) Ltd ආයතනය සමඟ ගිවිසුමකට ද එළඹෙන ලදී. එමෙන්ම ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියේ දෙවන අදියර සමඟ සම්බන්ධ වෙමින් දෙපාර්තමේන්තුව ලංකා රාජ්‍ය ජාලය සමඟ සම්බන්ධ කිරීම සඳහා WiFi තාක්ෂණය මගින් සියළුම දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා අන්තර්ජාල පහසුකම් සපයා දීමේ කටයුතු අවසන් කර ඇත.

# 03 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13 ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම්හි කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මඟපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබා දෙන ලදී.

### 03. 1 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී 1227 | 1952.02.02 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.07.26 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සී 2504 | 1973.03.01 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 |
| 06 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | සී 2651 | 1980.11.10 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 |
| 08 | සී/ස ශ්‍රී ලංකා තරුණසේවා සමුපකාර සමිති සංගමය | සී 2689 | 1986.01.01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 |
| 11 | සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය | සමු 29 | 2003.10.07 |
| 12 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ මහා සංගමය | සමු 30 | 2005.11.21 |
| 13 | සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | සමු 33 | 2007.02.23 |

## 03. 2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 39ක් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

## 03. 2.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

- ❖ සමාජික ඉතුරුම් රාශිකරණය
- ❖ සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
- ❖ සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
- ❖ ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

# දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති - 2017

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | සී 473 | 1928.03.15 |
| 02 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සී 503 | 1928.12.07 |
| 03 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | සී 736 | 1930.11.01 |
| 04 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සී 744 | 1930.11.10 |
| 05 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙණු පිළිබඳ සමිතිය | සී 290 | 1938.03.30 |
| 06 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | සී 303 | 1938.04.28 |
| 07 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 255 | 1939.10.20 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභ සාධක සමුපකාර සමිතිය | 1046 | 1943.11.23 |
| 09 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | සී 1649 | 1949.03.29 |
| 10 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරිකිරීමේ සමුපකාර සමිතිය | සී 1707 | 1950.08.30 |
| 11 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2233 | 1959.11.19 |
| 12 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කේ.ඊ. 299 | 1960.05.26 |
| 13 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සී 2266 | 1962.02.10 |
| 14 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සී 326 | 1962.02.10 |
| 15 | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙන සමිතිය | සී 2294 | 1963.01.26 |
| 16 | සී/ස සමුපකාර දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරි සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2357 | 1962.10.26 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2383 | 1967.10.01 |
| 18 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායිය සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2402 | 1968.08.29 |
| 19 | සී/ස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සී 931 | 1973.07.25 |
| 20 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | සමු 02 | 1989.12.20 |
| 21 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකරුවන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය | සමු 10 | 1994.02.09 |
| 22 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 18 | 1998.04.06 |
| 23 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | සමු 22 | 2000.06.26 |
| 24 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 25 | 2001.05.05 |
| 25 | සී/ස ජල සම්පාදන හා ජල ප්‍රවහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 31 | 2006.01.03 |

| | | | |
|---|---|---|---|
| 26 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 32 | 2006.11.29 |
| 27 | සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘධි සමුපකාර සමිතිය | සමු 43 | 2014.10.02 |
| 28 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ඉතිරිකිරීමේ හා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 44 | 2014.08.12 |
| 29 | සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සමුපකාර සමිතිය | සමු 46 | 2016.02.08 |
| 30 | සී/ස ශ්‍රී ලංකාවේ ව්‍යවසාය සංවර්ධන සමුපකාර සමිතිය | සමු 47 | 2016.02.08 |
| 31 | සී/ස ශ්‍රී ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය | සමු 48 | 2016.07.02 |
| 32 | සී/ස ජාතික පුහුණු වෘත්තීයවේදීන්ගේ සමුපකාර සමිතිය | සමු 51 | 2016.09.28 |

## 03. 2.2 දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිති වල මූලික කාර්යයන්

- සාමාජිකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම
- නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම
- සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම
- සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | සී 2280 | 1962.08.10 |
| 02 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | සී 2409 | 1969.11.28 |
| 03 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | සමු 03 | 1990.03.07 |
| 04 | සී/ස සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ සමුපකාර සමිතිය | සමු 07 | 1992.01.29 |
| 05 | සී/ස වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | සමු 28 | 2003.07.11 |
| 06 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යාවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | සමු 34 | 2007.03.07 |
| 07 | සී/ස සමස්ත ලංකා කෘෂි කාර්මික සමුපකාර සමිතිය | සමු 41 | 2010.01.05 |
| 08 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිති | සමු 36 | 2011.07.07 |
| 09 | සී/ස නිවාස හා දේපළ සංවර්ධන ස.ණ.ස | සමු 39 | 2011.07.07 |
| 10 | සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | සමු 40 | 2011.08.28 |
| 11 | සී/ස කිරි නිෂ්පාදකයින්ගේ ජාතික සමුපකාර සමිතිය | සමු 45 | 2014.10.02 |

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දුර : 0112-478374, 0112-478375 ෆැක්ස් : 0112-478386
වෙබ් : www.coop.gov.lk ඊ-මේල් : dcoopdev@sltnet.lk